මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය

நிதி, பொருளாதாரம் மற்றும் கொள்கை அபிவிருத்தி அமைச்சு

MINISTRY OF FINANCE, ECONOMY AND POLICY DEVELOPMENT

මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව. | செயலகம், கொழும்பு 01, இலங்கை. | The Secretariat, Colombo 01, Sri Lanka.

කාර්යාලය / அலுவலகம் / Office: 011 2484500, 011 2484600, 011 2484700

ෆැක්ස් / தொலைநகல் / Fax: 011 2449823

වෙබ් අඩවිය / இணைய தளம் / Website: www.treasury.gov.lk


මගේ අංකය / எனது இல / My No: බීඩී/සීබීපී/01/01/03-2019

ඔබේ අංකය / உமது இல / Your No:

දිනය / திகதி / Date: 2019.12.31

**අයවැය චක්‍රලේඛ අංක 09/2019**

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,

පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්,

දෙපාර්තමේන්තු ප්‍රධානීන්,

සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල සභාපතිවරුන්

**2020 අතුරු සම්මත ගිණුම යටතේ සම්මත වී ඇති අයවැය ප්‍රතිපාදන 2019.12.10 දිනැති අංක 2153/12 දරන ගැසට් පත්‍රය අනුව නව අමාත්‍යාංශ වලට යළි බෙදා හැරීම, වියදම් දැරීම සඳහා බලය දීම හා 2020 වසර සඳහා විසර්ජන පනතක් සම්මතවන තුරු ගිණුම්කරණ කටයුතු පවත්වාගෙනයාම සම්බන්ධයෙන් වන උපදෙස්**

## 1. අයවැය ප්‍රතිපාදන

### 1.1 වියදම්

**1:1:1** 2020 වර්ෂය සඳහා විසර්ජන පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් නොකරන ලද අතර විසර්ජන පනතක් සම්මත කරගන්නා තෙක් තාවකාලික විසඳුමක් ලෙස 2020 වර්ෂයේ මුල් මාස 04 ක කාලය සඳහා වියදම් පියවා ගැනීමට අවශ්‍ය වන අයවැය ප්‍රතිපාදන ඇතුළත් කරමින් අතුරු සම්මත ගිණුමක් (Vote on Account) පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදි. 2019.10.23 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද එම අතුරු සම්මත ගිණුම පිළියෙල කර ඇත්තේ 2019 වර්ෂයේ පැවති වැය ශීර්ෂ පදනම් කරගෙනය.

**1:1:2** 2019.12.10 දිනැති අංක 2153/12 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් එතෙක් කැබිනට් අමාත්‍යාංශ 31 ක් හා කැබිනට් නොවන අමාත්‍යාංශ 06 ක් යටතේ වෙන්කර තිබූ විෂයයන් හා කාර්යයන් නව අමාත්‍යාංශ 29 ක් යටතට වෙන්කර ඇත. එම සංශෝධනයට අනුකූලව නව අමාත්‍යාංශ වෙත පෙර පැවති අමාත්‍යාංශ අනුව සකස් කළ අතුරු සම්මත ගිණුමේ අයවැය ප්‍රතිපාදන බෙදාහැරීමට සිදුවේ.

**1:1:3** මේ සමඟ අමුණා ඇති උපලේඛන 01 හි (3) හා (4) තීරු මගින් 2020 අප්‍රේල් 30 දක්වා වන කාලය තුළ ඒ ඒ අමාත්‍යාංශ වෙත පැවරී ඇති විෂයයන් හා කාර්යයන් ඉටු කිරීමට අවශ්‍ය වන වියදම් සඳහා භාවිතා කළ

හැකි පුනරාවර්තන හා ප්‍රාග්ධන අයවැය ප්‍රතිපාදන ප්‍රමාණයන් දැක්වෙන අතර (2) තීරුවෙන් ඊට අදාළ වැය විෂයයන්ගේ විස්තර දක්වා ඇත.

**1:1:4** රජයේ නව ප්‍රතිපත්ති හා ප්‍රමුඛතාවයන් අනුව අදාළ වැය විෂයයන්ට වෙන්වී ඇති ප්‍රතිපාදන වල යම් සංශෝධනයක් කළයුතු වන්නේ නම් උපලේඛනයේ 1හි (3) හා (4) වන තීරුවල දැක්වෙන ඔබ ආයතනය වෙත වෙන්වී ඇති ප්‍රතිපාදන සීමාවන් නොඉක්මවන සේ වැය විෂයයන් අතර කළයුතු වෙනස්කම් සිදුකර ගැනීම සඳහා ජාතික අයවැය දෙපාර්තමේන්තුව ඔබ වෙත සහාය දක්වනු ඇත. එසේ අදාළ ආයතන සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් ඒ ඒ ආයතනයට අදාළ වැය විෂයයන් පිළිබඳ විස්තරාත්මක වියදම් ඇස්තමේන්තු ඉදිරියේදී ඔබ වෙත ලබාදෙනු ඇත.

**1:1:5** අතුරු සම්මත ගිණුම මඟින් සම්මත කරන ලද ප්‍රතිපාදන යොදා ගෙන වියදම් දැරීමට හැකිවන පරිදි නියමිත වොරන්ට් බලපත්‍ර වලට ගරු මුදල් අමාත්‍යතුමා විසින් අත්සන් තබා ඇත. ඒ අනුව, ගෙවීම් වවුචර් සහ අනෙකුත් අදාළ ලියකියවිලිවල සඳහන් කළයුතු බලපත්‍ර අංක පහත පරිදි වේ.

i. පොදු සේවා සඳහා - 2020 අංක 1 දරණ බලපත්‍රය (අතුරු සම්මත ගිණුම)
ii. විශේෂ නීති සේවා කටයුතු සඳහා - 2020 අංක 1 දරණ විශේෂ නීති සේවා අධිකාරී බලපත්‍රය (අතුරු සම්මත ගිණුම)
iii. අත්තිකාරම් ගිණුම් කටයුතු සඳහා - 2020 අංක 1 දරණ අත්තිකාරම් බලපත්‍රය (අතුරු සම්මත ගිණුම)

### 1.2 අත්තිකාරම් ගිණුම් කටයුතු සඳහා සීමාවන්

රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් "බී" ගිණුම යටතේ ණය පහසුකම් සැලසීමේදී උත්සව අත්තිකාරම් හා විශේෂ අත්තිකාරම් සඳහා ප්‍රමුඛතාවය ලබා දිය යුතුය. සියලුම නිලධාරීන් සඳහා උත්සව අත්තිකාරම් හා විශේෂ අත්තිකාරම් ලබා දීමට ප්‍රතිපාදන වෙන්කිරීමෙන් අනතුරුව <u>තවදුරටත් වියදම් සීමාවෙහි ඉතිරියක් පවතී නම් පමණක්</u> ආපදා ණය ලබාදීම කළ හැකිය. අතුරු සම්මත ගිණුම ක්‍රියාත්මක වන කාලය තුළ ඒ ඒ අමාත්‍යාංශ වලට අදාළ වන්නාවූ අත්තිකාරම් ගිණුම් සම්බන්ධයෙන් වන සීමාවන් මෙහි උපලේඛන 02 හි දක්වා ඇත.

### 2. අක්මුදල් නිදහස් කිරීම

**2:1** උපලේඛන 1 හා 2 ට අදාළව ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් ඔබ වෙත සපයනු ලබන විස්තරාත්මක ඇස්තමේන්තු පදනම් කරගෙන අතුරු සම්මත ගිණුම ක්‍රියාත්මක වන කාලය තුළ අවශ්‍ය අක්මුදල් නිදහස් කිරීමට භාණ්ඩාගාරය විසින් කටයුතු කරනු ඇත. මෙම ක්‍රියාවලිය තුළ 2020 මුල් මාස 04 සඳහා අක්මුදල් සීමාව ගණනය කළයුතු ආකාරය පිළිබඳ උපදෙස් භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් ඉදිරියේදී ලබාදීමට කටයුතු කරනු ඇත.

**2:2** එක් එක් නව අමාත්‍යාංශයට අදාළව වෙන් කරන ලද නිල බැංකු ගිණුම් අංකය සහ භාණ්ඩාගාර ලෙජරයේ පවත්වාගෙන යනු ලබන අනුමත අග්‍රිම ගිණුම් අංක මෙයට අමුණා ඇති 03 වන උපලේඛනයේ දක්වා ඇත. ඒ අනුව, 2019.12.10 දිනැති අංක 2153/12 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ සඳහන් නව අමාත්‍යාංශයේ නාමය අනුව 03 වන උපලේඛනයේ සඳහන් නිල බැංකු ගිණුම් වල නාමයන් ද වෙනස් කිරීම සඳහා අංක 3/2015 දරන භාණ්ඩාගාර මෙහෙයුම් චක්‍රලේඛයෙහි සඳහන් අදාළ ආකෘති පත්‍ර නිවැරදිව සම්පූර්ණ කර භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතුය.

### 3. ගිණුම් තැබීම

#### 3.1 වියදම් ගිණුම් තැබීම

3.1.1 යම් අමාත්‍යාංශයක් අහෝසි වී එහි සියලු කාර්යයන් වෙනත් එක් අමාත්‍යාංශයකට පමණක් එකතු වන විට වියදම් දැරීමේදී අහෝසි වූ අමාත්‍යාංශයට අදාළ අග්‍රිම ගිණුම තවදුරටත් ක්‍රියාත්මක නොවන බැවින් අතුරු සම්මත ගිණුම යටතේ වෙන් කරන ලද වියදම් දැරීම සඳහා තම කාර්යයන් පැවරූ අමාත්‍යාංශය වෙතින් අතුරු අග්‍රිමයක් ලබාගෙන උපකාර්යාලයක් ලෙස එම අමාත්‍යාංශයට වියදම් වාර්තා කළයුතුය.

**3.1.2** යම් අමාත්‍යාංශයක් අහෝසි වී එහි කාර්යයන් වෙනත් අමාත්‍යාංශ කිහිපයකට පැවරීමේදී වියදම් දැරීම සඳහා ඒ ඒ කාර්යයන් පැවරූ අමාත්‍යාංශ වලින් අතුරු අග්‍රිම ලබාගෙන ඒ ඒ අමාත්‍යාංශයේ උප කාර්යාලයක් ලෙස එම අමාත්‍යාංශයට වියදම් වාර්තා කිරීම සිදු කළයුතුය.

#### 3.2 අත්තිකාරම් ගිණුම් කටයුතු සම්බන්ධයෙන් ගිණුම් තැබීම

යම් අමාත්‍යාංශයක් අහෝසි වී එහි සියලුම කාර්යයන් වෙනත් එක් අමාත්‍යාංශයකට හෝ අමාත්‍යාංශ කිහිපයකට පැවරී ඇති විට අහෝසි වූ අමාත්‍යාංශය යටතේවූ අත්තිකාරම් ගිණුම් කටයුතු උපලේඛන 02 හි දක්වා ඇති සීමාවන්ට යටත්ව නව අමාත්‍යාංශ විසින් සිදුකල යුතුය. ඊට අදාල ගිණුම් කටයුතු අතුරු සම්මත ගිණුම ක්‍රියාත්මක වන කාලය තුළ අහෝසි වූ අමාත්‍යාංශයට වෙන්වූ ගිණුම් අංක යටතේම සිදු කළයුතුය.

#### 3.3 තැන්පතු හා වත්කම් ගිණුම් කටයුතු

**3.3.1** යම් අමාත්‍යාංශයක් අහෝසි වී එහි සියලු කාර්යයන් වෙනත් එක් අමාත්‍යාංශයකට පමණක් එකතු වන විට අහෝසි වූ අමාත්‍යාංශය යටතේ වූ තැන්පතු හා වත්කම් ගිණුම් කටයුතු අතුරු සම්මත ගිණුම ක්‍රියාත්මක වන කාලය සඳහා අහෝසි වූ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ගිණුම් අංකය යටතේම සිදු කළයුතුය.

**3.3.2** යම් අමාත්‍යාංශයක් අහෝසි වී එහි කාර්යයන් වෙනත් අමාත්‍යාංශ කිහිපයකට පැවරී ඇති අවස්ථාවලදී අහෝසි වූ අමාත්‍යාංශයේ කාර්යයන්ගෙන් වැඩි ප්‍රමාණයක් පවරාගන්නා ලද නව අමාත්‍යාංශය විසින් අහෝසි වූ අමාත්‍යාංශයේ තැන්පතු සහ වත්කම් ගිණුම් දැනටමත් භාවිතා කරන අංක යටතේම පවත්වාගෙන යායුතුය.

### 4. අනුමත අග්‍රිම ගිණුම් සහ නිල බැංකු ගිණුම්

නව අමාත්‍යාංශවලට විෂය පථයන් අනුයුක්ත කිරීම හේතුකොට ගෙන අහෝසි වී ගිය පෙර පැවති අමාත්‍යාංශවලට අදාළ අක්‍රිය නිල බැංකු ගිණුම් සහ අනුමත අග්‍රිම ගිණුම් සැසඳීම් කර වසා දැමීමේ කාර්යයේ වගකීම පෙර පැවති අමාත්‍යාංශයේ ප්‍රධාන මූල්‍ය නිලධාරී / ප්‍රධාන ගණකාධිකාරී වෙත මෙයින් පවරනු ලැබේ. මෙම කාර්යය සඳහා වැඩිදුරටත් උපදෙස් අවශ්‍ය වන්නේ නම් ඒ සඳහා භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව ඇමතිය යුතුය.

### 5. 2020 වර්ෂය සඳහා වියදම් කළමනාකරණය කිරීම

**5:1** අතුරු සම්මත ගිණුමෙන් වියදම් දැරීමට අවසර ලැබෙනුයේ 2019 වර්ෂයේ ඇස්තමේන්තුවල ඇතුළත් වූ 2020 වර්ෂය සඳහා තවදුරටත් පවත්වාගෙන යායුතු වැඩසටහන්, ව්‍යාපෘති හා විෂයයන් සඳහා පමණි. එම

නිසා අතුරු සම්මත ගිණුම ක්‍රියාත්මක වන කාලය තුළ අළුත් කාර්යය මණ්ඩල වියදම්, අළුත් සැපයුම් හා සේවාවන් හා නව කාර්යයන් හා ව්‍යාපෘතීන් සම්බන්ධයෙන් බැඳීම් ඇති කර නොගත යුතුය.

**5:2** නීතිමය කරුණු හේතුවෙන් 2020 වර්ෂයේ අතුරු සම්මත ගිණුම ක්‍රියාත්මක වන කාලය සඳහා ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ "පරිපූරක සහාය සේවා සහ හදිසි අවශ්‍යතා වගකීම්" ව්‍යාපෘතිය යටතේ ප්‍රතිපාදන කිසිවක් වෙන්කර නැත. එබැවින් ප්‍රතිපාදන වෙන්වී නැති නමුත් අත්‍යවශ්‍යවන වියදමක් ඇති වුවහොත් එවැනි වියදම්ද ඒ ඒ ආයතන වෙත දැනටමත් වෙන්වී ඇති ප්‍රතිපාදන තුලින්ම කළමනාකරණය කරගැනීමට වැය දරන ආයතන විසින් අවශ්‍ය විධිවිධාන සලසාගත යුතු බව තරයේ අවධාරණය කරමි.

**5:3** එසේම, රාජ්‍ය ආයතන වල වියදම් දැරීමේදී අරපිරිමැසුම්දායී හා නාස්තිය අවම වන අයුරින් කටයුතු කිරීම සම්බන්ධ විධිවිධාන කෙරෙහි සියලු ආයතන ප්‍රධානීන් තම පෞද්ගලික අවධානය යොමු කළයුතු බවට අයවැය චක්‍රලේඛ 04/2019, 05/2019 හා 07/2019 මඟින් දැනටමත් උපදෙස් ලබා දී ඇත. එම චක්‍රලේඛවල උපදෙස් හා විධිවිධාන ඉදිරියටත් වලංගු වේ.

**5:4** ඇතැම් රාජ්‍ය ආයතන විසින් පුහුණු වැඩසටහන්, සම්මන්ත්‍රණ, වැඩමුළු සහ ඇතැම් උත්සව පැවැත්වීමේදී අධික පිරිවැයක් දරමින් ඉහළ පන්තියේ හෝටල් වල පවත්වන බව නිරීක්ෂණය වේ. විශේෂයෙන් විදේශ ණය/ආධාර මත ක්‍රියාත්මක වන ව්‍යාපෘති වලදී ඉහත පරිදි කටයුතු කිරීම බහුලව දක්නට ලැබේ. ණය/අධාර සපයන ආයතන විසින් ඒවා සපයනු ලබන්නේ හුදෙක් රටේ සංවර්ධන කාර්යයන්ට දායකත්වය වැඩිකිරීමට වන බැවින් පිරිවැය අවම කරමින් සංවර්ධනයට වන දායකත්වය ඉහළ නැංවීමට වගබලා ගත යුතුය. එබැවින් හැකි සෑම විටම ඉහත සඳහන් කළ වැඩසටහන් සඳහා ශ්‍රී ලංකා පදනම් ආයතනය, ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය, යෝධ වැව නායකත්ව පුහුණු මධ්‍යස්ථානය, පේරාදෙණිය කෘෂිකර්ම පුහුණු ආයතනය වැනි රජයේ ආයතන වල පහසුකම් භාවිතා කළයුතුය.

**6. 2020 වර්ෂය සඳහා විසර්ජන පනත**

මේ අවස්ථාවේදී විවිධ වැය ශීර්ෂ යටතේ නව අමාත්‍යාංශ වෙත ලබාදුන් අයවැය ප්‍රතිපාදන 2020 වර්ෂය සඳහා විසර්ජන පනත් කෙටුම්පත සකස් කිරීමේදී ඒ ඒ අමාත්‍යාංශය වෙතම වෙන්වූ එක් එක් වැය ශීර්ෂ වෙත ගොනු කිරීමට කටයුතු කරනු ඇත. ඒ සඳහා වන ගිණුම්කරණමය ගැලපීම් සඳහා ඉදිරියේදී උපදෙස් දීමට කටයුතු කරනු ඇත.

**එස්.ආර්. ආටිගල**
**භාණ්ඩාගාර ලේකම්**

පිටපත්:

1. ජනාධිපති ලේකම්
2. අග්‍රාමාත්‍ය ලේකම්
3. අමාත්‍ය මණ්ඩල ලේකම්
4. විගණකාධිපති

**2020 අතුරු සම්මත ගිණුම යටතේ සම්මත වී ඇති අයවැය ප්‍රතිපාදන 2019.12.10 දිනැති අංක 2153/12 දරන ගැසට් පත්‍රය අනුව නව අමාත්‍යාංශ වලට යලි බෙදා හැරීම**

රු. 000'

| නව අමාත්‍යාංශය/විශේෂ වියදම් ඒකකයන්හි නම් (1) | නව අමාත්‍යාංශයට අයත් කාර්යයන් කරගන යාමට අදාලව පවතින අයවැය ප්‍රතිපාදන | | |
|---|---|---|---|
| | වැය විෂයය විස්තර (2) | අතුරු සම්මත ගිණුම පුනරාවර්තන (3) | අතුරු සම්මත ගිණුම මූලධන (4) |
| අතිගරු ජනාධිපති | | **952,930** | **526,970** |
| | **වැය ශීර්ෂ 01 අතිගරු ජනාධිපති** | | |
| | පහත සඳහන් වැය විෂයයන් හැර වැය ශීර්ෂ 1 යටතේ පවතින ව්‍යාපෘති 01-01-04-25-(1503)(2201), 01-01-04-32-(2202)(2302), 01-02-06-06-2509-1, 01-02-06-06-2509-2, 01-02-06-06-2509-3, 01-02-06-06-2509-4, 01-02-06-06-2509-5, 01-02-06-09-2509, 01-02-06-11-2509-1, 01-02- 06-11-2-2509 , 01-02-06-13-2509 සහ 01-01-02 (1001,1003,1202,1401,1402),01-01-02 (1001,1003,1202,1401,1402-ග්‍රාමශක්ති), 01-01-02 (1001,1003,1202,1401-ස්මාර්ට් ශ්‍රී ලංකා) | 952,930 | 526,970 |
| අධ්‍යාපන | | **20,249,170** | **8,598,300** |
| | **වැය ශීර්ෂ 126 අධ්‍යාපන අමාත්‍යාංශය** | | |
| | වැය ශීර්ෂ 126 යටතේ පවතින ව්‍යාපෘති | 20,249,170 | 8,598,300 |
| සෞඛ්‍ය, දේශීය වෛද්‍ය සේවා | | **50,731,111** | **8,899,545** |
| | **වැය ශීර්ෂ 111සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය** | | |
| | වැය ශීර්ෂ 111 යටතේ පවතින ව්‍යාපෘති | 50,456,111 | 8,587,900 |
| | **වැය ශීර්ෂ 53 ආර්ථික ප්‍රතිසංස්කරණ සහ පොදු සැපයීම් අමාත්‍ය මණ්ඩලයේ සාමාජික නොවන අමාත්‍යාංශය** | | |
| | 53-01-02-04-1503 | 275,000 | - |
| | 53-01-02-04-2201 | - | 281,645 |
| | **වැය ශීර්ෂ 01 අතිගරු ජනාධිපති** | | |
| | 01-02-06-06- 2509-3 | - | 30,000 |
| තොරතුරු සංනිවේදන තාක්ෂණ අමාත්‍යවරයා | | **294,928** | **773,339** |
| | **වැය ශීර්ෂ 51 ඩිජිටල් යටිතල පහසුකම් සහ තොරතුරු තාක්ෂණ අමාත්‍ය මණ්ඩලයේ සාමාජික නොවන අමාත්‍යාංශය** | | |
| | පහත සඳහන් වැය විෂයයන් හැර වැය ශීර්ෂ 51 යටතේ පවතින ව්‍යාපෘති 51-02-03-13-(1508)(2505), 51-02-03-14-(1508)(2505) | 75,424 | 596,194 |
| | **වැය ශීර්ෂ 55 ජනමාධ්‍ය අමාත්‍ය මණ්ඩලයේ සාමාජික නොවන අමාත්‍යාංශය** | | |
| | 55-01-02 | 54,400 | 64,250 |
| | 55-02-03 | 120,000 | 103,200 |
| | **වැය ශීර්ෂ 108 තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යාංශය** | | |
| | 108-01-01 | 13,440 | 2,025 |
| | 108-01-02 (ව්‍යපෘතියෙන් කොටසක්) | 29,064 | 2,670 |
| | **වැය ශීර්ෂ 123 නිවාස, ඉදිකිරීම් සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය** | | |
| | 123-02-06-18-(1503)(2201) | 2,600 | 5,000 |

රු. 000'

| නව අමාත්‍යාංශය/විශේෂ වියදම් ඒකකයන්හි නම් | නව අමාත්‍යාංශයට අයත් කාර්යයන් කරගෙන යාමට අදාලව පවතින අයවැය ප්‍රතිපාදන | | |
|---|---|---|---|
| | වැය විෂයය විස්තර | අතුරු සම්මත ගිණුම පුනරාවර්තන | අතුරු සම්මත ගිණුම මූලධන |
| (1) | (2) | (3) | (4) |
| ආරක්ෂක | | **8,156,822** | **5,548,772** |
| | **වැය ශීර්ෂ 103 ආරක්ෂක අමාත්‍යාංශය** | | |
| | වැය ශීර්ෂ 103 යටතේ පවතින ව්‍යාපෘති | 7,620,895 | 2,530,480 |
| | **වැය ශීර්ෂ130 රාජ්‍ය පරිපාලන, ආපදා කළමනාකරණ සහ පශු සම්පත් සංවර්ධන අමාත්‍යාංශය** | | |
| | 130-01-06 | 34,505 | 1,501,850 |
| | 130-02-07 | 109,200 | 46,617 |
| | 130-02-08 | 185,888 | 277,600 |
| | 130-02-09 | 7,000 | 583,000 |
| | **වැය ශීර්ෂ 155 අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය** | | |
| | 155-01-09 | 42,500 | 302,225 |
| | **වැය ශීර්ෂ 157 ජාතික ඒකාබද්ධතා, රාජ්‍ය භාෂා, සමාජ ප්‍රගති සහ හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශය** | | |
| | 157-01-02 | 13,740 | - |
| | 157-01-02-03-2201 | - | 2,000 |
| | **වැය ශීර්ෂ 51 ඩිජිටල් යටිතල පහසුකම් සහ තොරතුරු තාක්ෂණ අමාත්‍ය මණ්ඩලයේ සාමාජික නොවන අමාත්‍යාංශය** | | |
| | 51-02-03-13-(1508)(2205) | 28,094 | 65,000 |
| | 51-02-03-14-(1508)(2205) | 115,000 | 220,000 |
| | **වැය ශීර්ෂ 01 අතිගරු ජනාධිපති** | | |
| | 01-02-06-06-2-2509 | - | 20,000 |
| රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන | | **4,209,850** | **9,135,935** |
| | **වැය ශීර්ෂ 155 අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය** | | |
| | පහත සඳහන් වැය විෂයයන් හැර වැය ශීර්ෂ 155 යටතේ පවතින ව්‍යාපෘති 155,-01-01, 155-01-09 | 3,626,529 | 8,823,385 |
| | **වැය ශීර්ෂ 130 රාජ්‍ය පරිපාලන, ආපදා කළමනාකරණ සහ පශු සම්පත් සංවර්ධන අමාත්‍යාංශය** | | |
| | 130-01-01 | 18,250 | 2,050 |
| | 130-01-02 | 245,391 | 184,450 |
| | 130-01-04 | 7,878 | 10,700 |
| | **වැය ශීර්ෂ 102 මුදල් අමාත්‍යාංශය** | | |
| | 102-01-02-14-2401 | - | 15,000 |
| | **වැය ශීර්ෂ157 ජාතික ඒකාබද්ධතා, රාජ්‍ය භාෂා, සමාජ ප්‍රගති සහ හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශය** | | |
| | 157-01-02-01-(1503)(2201) | 13,650 | 850 |
| | 157-01-02-02-(1503)(2201) | 26,500 | 20,000 |
| | 157-01-03-01-2509 | - | 15,000 |
| | 157-01-03-23-2509 | - | 35,000 |
| | 157-01-03 (මෙම වැය විෂයයන්ගෙන් කොටසක් 1001,1002,1003,1101,1201,1202,1203,1301,1302,1402,1403,1404,1409,1506) | 7,452 | |
| | 157-01-03-1703 | 1,500 | |
| | **වැය ශීර්ෂ 122 ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ** | | |
| | 122-01-02 | 254,700 | 21,500 |
| | **වැය ශීර්ෂ 104 ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යාංශය** | | |
| | 104-02-05-04 | 8,000 | 8,000 |

රු. 000'

| නව අමාත්‍යාංශය/විශේෂ වියදම් ඒකකයන්හි නම් (1) | නව අමාත්‍යාංශයට අයත් කාර්යයන් කරගෙන යාමට අදාලව පවතින අයවැය ප්‍රතිපාදන<br>වැය විෂයය විස්තර (2) | අතුරු සම්මත ගිණුම පුනරාවර්තන (3) | අතුරු සම්මත ගිණුම මූලධන (4) |
|---|---|---|---|
| ඉඩම් හා ඉඩම් සංවර්ධන | | **120,300** | **2,767,500** |
| | **වැය ශීර්ෂ 122 ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ** | | |
| | පහත සඳහන් වැය විෂයයන් හැර වැය ශීර්ෂ 122 යටතේ පවතින ව්‍යාපෘති 122-01-02 | 120,300 | 2,767,500 |
| පරිසර වනජීවී සම්පත් | | **414,950** | **671,063** |
| | **වැය ශීර්ෂ 160 මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය** | | |
| | පහත සඳහන් වැය විෂයයන් හැර වැය ශීර්ෂ 160 යටතේ පවතින ව්‍යාපෘති 160-01-02(ව්‍යාපෘතියෙන් කොටසක්), 160-02-05, 160-02-04-03-(1503)(2201), 160-02-04-06, 160-02-04-05, 160-02-04-07-(1503)(2201) | 374,400 | 648,823 |
| | **වැය ශීර්ෂ 159 සංචාරක සංවර්ධන, වනජීවී සහ ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශය** | | |
| | 159-01-03 | 40,550 | 2,240 |
| | **වැය ශීර්ෂ 01 අතිගරු ජනාධිපති** | | |
| | 01-02-06-06-2509-1 | - | 20,000 |
| සංචාරක සහ ගුවන් සේවා | | **48,240** | **139,260** |
| | **වැය ශීර්ෂ 159 සංචාරක සංවර්ධන, වනජීවී සහ ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශය** | | |
| | පහත සඳහන් වැය විෂයයන් හැර වැය ශීර්ෂ 159 යටතේ පවතින ව්‍යාපෘති 159-01-03 | 48,240 | 139,260 |
| මහවැලි, කෘෂිකර්ම වාරිමාර්ග සහ ග්‍රාමීය සංවර්ධන | | **14,975,637** | **13,830,851** |
| | **වැය ශීර්ෂ 118 කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය** | | |
| | පහත සඳහන් වැය විෂයයන් හැර වැය ශීර්ෂ 118 යටතේ පවතින ව්‍යාපෘති 118-01-09, 118-02-14,118-02-15 | 13,994,867 | 5,766,421 |
| | **වැය ශීර්ෂ 130 රාජ්‍ය පරිපාලන, ආපදා කළමනාකරණ සහ පශු සම්පත් සංවර්ධන අමාත්‍යාංශය** | - | - |
| | 130-02-10 | 69,607 | 179,070 |
| | **වැය ශීර්ෂ 160 මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය** | | |
| | 160-01-02 | 19,685 | 1,510 |
| | 160-02-05 | - | 6,882,700 |
| | 160-02-04-05 | 860,000 | 500,000 |
| | 160-02-04-06 | 1,000 | 3,000 |
| | **වැය ශීර්ෂ 01 අතිගරු ජනාධිපති** | | |
| | 01-01-04-32-2202 | - | 126,800 |
| | 01-01-04-32-2302 | - | 125,000 |
| | 01-02-06-09-2509 | - | 40,000 |
| | 01-02-06-11-2509-1 | - | 50,000 |
| | **වැය ශීර්ෂ 56 විශේෂ ප්‍රදේශ සංවර්ධන අමාත්‍ය මණ්ඩලයේ සාමාජික නොවන අමාත්‍යාංශය** | | |
| | 56-01-02 | 20,178 | 6,350 |
| | **වැය ශීර්ෂ 101 බුද්ධශාසන හා වයඹ සංවර්ධන අමාත්‍යාංශය** | | |
| | 101-02-07 | 10,300 | 150,000 |

රු. 000'

| නව අමාත්‍යාංශය/විශේෂ වියදම් ඒකකයන්හි නම් | නව අමාත්‍යාංශයට අයත් කාර්යයන් කරගෙන යාමට අදාලව පවතින අයවැය ප්‍රතිපාදන | | |
|---|---|---|---|
| | වැය විෂයය විස්තර | අතුරු සම්මත ගිණුම පුනරාවර්තන | අතුරු සම්මත ගිණුම මූලධන |
| (1) | (2) | (3) | (4) |
| ධීවර හා ජලජ සම්පත් | | **549,103** | **1,543,042** |
| | **වැය ශීර්ෂ 118 කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය** | | |
| | 118-01-09,118-02-14,118-02-15 | 531,785 | 1,540,382 |
| | **වැය ශීර්ෂ 53 ආර්ථික ප්‍රතිසංස්කරණ සහ පොදු සැපයීම් අමාත්‍ය මණ්ඩලයේ සාමාජික නොවන අමාත්‍යාංශය** | | |
| | 53-01-01 | 9,646 | 1,110 |
| | **වැය ශීර්ෂ 56 විශේෂ ප්‍රදේශ සංවර්ධන අමාත්‍ය මණ්ඩලයේ සාමාජික නොවන අමාත්‍යාංශය** | | |
| | 56-01-01 | 7,672 | 1,550 |
| මුදල්,ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන | | **2,690,447** | **7,699,975** |
| | **වැය ශීර්ෂ 102 මුදල් අමාත්‍යාංශය** | | |
| | පහත සඳහන් වැය විෂයයන් හැර වැය ශීර්ෂ 102 යටතේ පවතින | 732,307 | 843,585 |
| | ව්‍යාපෘති102-01-02-14-2401 | - | - |
| | **වැය ශීර්ෂ 53 ආර්ථික ප්‍රතිසංස්කරණ සහ පොදු සැපයීම්** | | |
| | 53-01-02-01-1503 | 13,060 | - |
| | 53-01-02 | 30,230 | 9,140 |
| | **වැය ශීර්ෂ 160 මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය** | | |
| | 160-02-04-07-(1503)(2201) | 1,500 | 7,000 |
| | **වැය ශීර්ෂ 104 ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යාංශය** | | |
| | 104-01-01 | 7,350 | 750 |
| | 104-01-10 | 31,100 | 800 |
| | 104-01-02 | 1,874,900 | 4,600 |
| | 104-02-06 | - | 6,834,100 |
| ක්‍රීඩා හා තරුණ කටයුතු | | **1,077,735** | **2,131,308** |
| | **වැය ශීර්ෂ 194 විදුලි සංදේශ, විදේශ ර.කියා සහ ක්‍රීඩා අමාත්‍යාංශය** | | |
| | පහත සඳහන් වැය විෂයයන් හැර වැය ශීර්ෂ 194 යටතේ පවතින ව්‍යාපෘති 194-01-03 | 228,222 | 1,322,458 |
| | **වැය ශීර්ෂ 104 ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යාංශය** | | |
| | 104-01-11 | 8,050 | 750 |
| | 104-01-09 | 42,050 | 1,900 |
| | 104-02-05-02 | 300,000 | 200,000 |
| | 104-02-05-03 | 350,000 | 200,000 |
| | 104-02-07 | 119,100 | 377,900 |
| | 104-02-08 | 21,250 | 3,300 |
| | **වැය ශීර්ෂ 01 අතිගරු ජනාධිපති** | | |
| | 01-02-06-13-2509 | - | 25,000 |
| | 01-01-02 (1001,1003,1202,1401-ස්මාර්ට් ශ්‍රී ලංකා) | 9,063 | - |
| අධිකරණ, මානව හිමිකම් හා නීති ප්‍රතිසංස්කරණ | | **861,025** | **1,178,915** |
| | **වැය ශීර්ෂ 110 අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය** | | |
| | වැය ශීර්ෂ 110 යටතේ පවතින ව්‍යාපෘති | 280,460 | 39,665 |

රු. 000'

| නව අමාත්‍යාංශය/විශේෂ වියදම් ඒකකයන්හි නම් | නව අමාත්‍යාංශයට අයත් කාර්යයන් කරගන යාමට අදාලව පවතින අයවැය ප්‍රතිපාදන | | |
|---|---|---|---|
| | වැය විෂයය විස්තර | අතුරු සම්මත ගිණුම පුනරාවර්තන | අතුරු සම්මත ගිණුම මූලධන |
| (1) | (2) | (3) | (4) |
| | **වැය ශීර්ෂ 104 ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යාංශය** | | |
| | 104-01-12-04-(1503)(2201) | 310,000 | 50,000 |
| | 104-01-12-05-(1508)(2201) | 60,000 | 170,000 |
| | **වැය ශීර්ෂ 157 ජාතික ඒකාබද්ධතා, රාජ්‍ය භාෂා, සමාජ ප්‍රගති සහ හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශය** | | |
| | 157-01-01 | 12,500 | 1,500 |
| | 157-01-02 | 148,322 | 513,000 |
| | 157-01-03 | 49,743 | 404,750 |
| මාර්ග මහාමාර්ග | | **79,820** | **62,177,265** |
| | **වැය ශීර්ෂ 117 මහාමාර්ග හා මාර්ග සංවර්ධන සහ ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශය** | | |
| | පහත සඳහන් වැය විෂයයන් හැර වැය ශීර්ෂ 117 යටතේ පවතින ව්‍යාපෘති 117-01-11, 117-01-16, 117-02-17 | 79,820 | 62,177,265 |
| විදුලිබල හා බලශක්ති | | **261,360** | **262,135** |
| | **වැය ශීර්ෂ 119 විදුලිබල, බලශක්ති සහ ව්‍යාපාර සංවර්ධන අමාත්‍යාංශය** | | |
| | වැය ශීර්ෂ 119 යටතේ පවතින ව්‍යාපෘති | 193,015 | 243,400 |
| | **වැය ශීර්ෂ 117 මහාමාර්ග හා මාර්ග සංවර්ධන සහ ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශය** | | |
| | 117-01-11 | 7,370 | 735 |
| | 117-01-16 | 31,975 | 2,000 |
| | 117-02-17 | 29,000 | 16,000 |
| කාන්තා, ළමා කටයුතු සහ සමාජ ආරක්ෂණ | | **7,312,374** | **718,760** |
| | **වැය ශීර්ෂ 120 කාන්තා හා ළමා කටයුතු සහ වියළි කලාප සංවර්ධන අමාත්‍යාංශය** | | |
| | වැය ශීර්ෂ 120 යටතේ පවතින ව්‍යාපෘති | 2,188,354 | 501,480 |
| | **වැය ශීර්ෂ 124 ප්‍රාථමික කර්මාන්ත සහ සමාජ සවිබල ගැන්වීම් අමාත්‍යාංශය** | | |
| | 124-01-01 | 17,720 | 520 |
| | 124-1-11 | 8,810 | 270 |
| | 124-01-02 | 143,030 | 12,960 |
| | 124-02-04 | 4,941,250 | 22,830 |
| | 124-02-05 | 13,210 | 150,700 |
| | **වැය ශීර්ෂ 01 අතිගරු ජනාධිපති** | | |
| | 01-02-06-06-2509-4 | - | 20,000 |
| | 01-02-06-06-2509-5 | - | 10,000 |
| වැවිලි කර්මාන්ත සහ අපනයන කෘෂිකර්ම | | **1,132,837** | **1,886,350** |
| | **වැය ශීර්ෂ 135 වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය** | | |
| | වැය ශීර්ෂ 135 යටතේ පවතින ව්‍යාපෘති | 1,088,067 | 1,447,700 |
| | **වැය ශීර්ෂ 124 ප්‍රාථමික කර්මාන්ත සහ සමාජ සවිබල ගැන්වීම් අමාත්‍යාංශය** | | |
| | 124-01-03 | 43,070 | 1,400 |
| | 124-02-06 | - | 430,000 |
| | **වැය ශීර්ෂ 158 රාජ්‍ය ව්‍යවසාය, කන්ද උඩරට උරුමය සහ මහනුවර සංවර්ධන අමාත්‍යාංශය** | | |
| | 158-02-04-03 | - | - |
| | 158-01-02-1508 | 1,700 | - |
| | 158-01-02-2501 | - | 7,250 |

රු. 000'

| නව අමාත්‍යාංශය/විශේෂ වියදම් ඒකකයන්හි නම් | නව අමාත්‍යාංශයට අයත් කාර්යයන් කරගන යාමට අදාලව පවතින අයවැය ප්‍රතිපාදන | | |
|---|---|---|---|
| | වැය විෂයය විස්තර | අතුරු සම්මත ගිණුම පුනරාවර්තන | අතුරු සම්මත ගිණුම මූලධන |
| (1) | (2) | (3) | (4) |
| ප්‍රජා සවිබලගැන්වීම් සහ වතු යටිතල පහසුකම් සංවර්ධන | | **271,057** | **2,339,635** |
| | **වැය ශීර්ෂ 140 කඳුරට නව ගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය** | | |
| | වැය ශීර්ෂ 140 යටතේ පවතින ව්‍යාපෘති | 130,150 | 756,530 |
| | **වැය ශීර්ෂ 104 ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යාංශය** | | |
| | 104-02-14 | 40,000 | 1,080,000 |
| | 104-01-12 | 62,150 | 2,000 |
| | **වැය ශීර්ෂ 149 කර්මාන්ත හා වාණිජ කටයුතු, දිගුකාලීනව අවතැන් වූ පුද්ගලයන් නැවත පදිංචි කිරීම, සමුපකාර සංවර්ධන සහ වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය** | | |
| | 149-01-02-13-2202 | - | - |
| | 149-01-02-14-2506 | - | - |
| | 149-01-02-15-2202 | - | 100,000 |
| | 149-01-02-16-1409 | 14,000 | - |
| | **වැය ශීර්ෂ 01 අතිගරු ජනාධිපති** | | |
| | 01-02-06-11-2509-2 | - | 400,000 |
| | 01-01-02 (1001,1003,1202,1401,1402-ග්‍රාමශක්ති) | 13,312 | - |
| | **වැය ශීර්ෂ 155 අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය** | | |
| | 155-01-01 | 11,445 | 1,105 |
| කර්මාන්ත සහ සැපයුම් කළමනාකරණ | | **399,750** | **351,220** |
| | **වැය ශීර්ෂ 149 කර්මාන්ත හා වාණිජ කටයුතු, දිගුකාලීනව අවතැන් වූ පුද්ගලයන් නැවත පදිංචි කිරීම, සමුපකාර සංවර්ධන සහ වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය** | | |
| | පහත සඳහන් වැය විෂයයන් හැර වැය ශීර්ෂ 149 යටතේ පවතින ව්‍යාපෘති 149-01-11,149-01-02-01-2501, 149-02-05-07-(1503)(2201), 149-02-03-24-2202, 149-02-03-26-2202, 149-02-03-27-2202, 149-02-03-29-2202, 149-02-03-34-2001, 149-02-05-08-(1503)(2201), | 332,750 | 319,220 |
| | 149-02-05-02-(1503)(2201), 149-02-05-09-(1503)(2201), 149-02-05-10-(1503)(2201), 149-02-05-17-1503 Laksala, 149-02-03-12-2202, 149-01-02-13-2202, 149-01-02-14-2506, 149-01-02-15-2202, 149-01-02-16-1409, 149-01-12-11, 149-01-12-12, | | |
| | 149-01-12-02-(1503)(2201), 149-01-12-03-(1503)(2201), 149-01-12-04-(1503)(2201), 149-01-12-13-(1503)(2201), 149-01-12( excluding sub project 11,12,02,03,04,13), 149-02-06 | | |
| | **වැය ශීර්ෂ 104 ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යාංශය** | | |
| | 104-01-12-06-1503/2201 | 40,000 | 10,000 |
| | **වැය ශීර්ෂ160 මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය** | | |
| | 160-02-04-03-1503/2201 | 27,000 | 22,000 |

රු. 000'

| නව අමාත්‍යාංශය/විශේෂ වියදම් ඒකකයන්හි නම් | නව අමාත්‍යාංශයට අයත් කාර්යයන් කරගන යාමට අදාලව පවතින අයවැය ප්‍රතිපාදන | | |
|---|---|---|---|
| | වැය විෂයය විස්තර | අතුරු සම්මත ගිණුම පුනරාවර්තන | අතුරු සම්මත ගිණුම මූලධන |
| (1) | (2) | (3) | (4) |
| අභ්‍යන්තර වෙළඳ, ආහාර සුරක්ෂිතතාවය සහ පාරිභෝගික සුබසාධන අමාත්‍යවරයා | | **218,880** | **112,560** |
| | **වැය ශීර්ෂ 55 ජනමාධ්‍ය අමාත්‍ය මණ්ඩලයේ සාමාජික නොවන අමාත්‍යාංශය** | | |
| | 55-01-01 | 5,980 | 760 |
| | **වැය ශීර්ෂ 149 කර්මාන්ත හා වාණිජ කටයුතු, දිගුකාලීනව අවතැන් වූ පුද්ගලයන් නැවත පදිංචි කිරීම, සමුපකාර සංවර්ධන සහ වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය** | | |
| | 149-01-11 | 19,650 | 1,500 |
| | 149-01-02-01-2501 | - | 300 |
| | 149-02-05-07-1503/2201 | 180,000 | 5,000 |
| | 149-02-03-24-2202 | - | - |
| | 149-02-03-26-2202 | - | 50,000 |
| | 149-02-03-27-2202 | - | 25,000 |
| | 149-02-03-29-2202 | - | 25,000 |
| | 149-02-03-34-2001 | - | - |
| | 149-02-05-08-(1503)(2201) | 13,250 | 5,000 |
| කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සහ ව්‍යවසාය සංවර්ධන | | **155,520** | **63,400** |
| | **වැය ශීර්ෂ 158 රාජ්‍ය ව්‍යවසාය, කන්ද උඩරට උරුමය සහ මහනුවර සංවර්ධන අමාත්‍යාංශය** | | |
| | පහත සඳහන් වැය විෂයයන් හැර වැය ශීර්ෂ 158 යටතේ පවතින ව්‍යාපෘති 158-02-04-03, 158-01-02-(1508)(2501), 158-02-05 | 75,520 | 3,400 |
| | **වැය ශීර්ෂ 149 කර්මාන්ත හා වාණිජ කටයුතු, දිගුකාලීනව අවතැන් වූ පුද්ගලයන් නැවත පදිංචි කිරීම, සමුපකාර සංවර්ධන සහ වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය** | | |
| | 149-02-05-02-1503/2201 | 13,000 | 10,000 |
| | 149-02-05-09-1503/2201 | 24,000 | 5,000 |
| | 149-02-05-10-1503/2201 | 43,000 | 35,000 |
| | 149-02-05-10-1503 Laksala | - | - |
| | 149-02-03-12-2202 | - | 10,000 |
| නිපුණතා සංවර්ධන,රැකීරක්ෂා හා කම්කරු සබඳතා | | **1,767,062** | **1,302,810** |
| | **වැය ශීර්ෂ 54 කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය මණ්ඩලයේ සාමාජික නොවන අමාත්‍යාංශය** | | |
| | වැය ශීර්ෂ 54 යටතේ පවතින ව්‍යාපෘති | 86,580 | 4,670 |
| | **වැය ශීර්ෂ 149 කර්මාන්ත හා වාණිජ කටයුතු, දිගුකාලීනව අවතැන් වූ පුද්ගලයන් නැවත පදිංචි කිරීම, සමුපකාර සංවර්ධන සහ වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය** | | |
| | 149-01-12-02-1503/2201 | 50,000 | 3,500 |
| | 149-01-12-03-1503/2201 | 580,000 | 30,000 |
| | 149-01-12-04-1503/2201 | 380,000 | 15,000 |
| | 149-01-12-13-1503/2201 | 140,000 | 15,000 |
| | 149-01-12 (පහත ව්‍යාපෘති හැර 149-01-12-11(1503)(2201),149-01-12-12(1503)(2201), 149-01-12-02(1503)(2201), 149-01-12-03(1503)(2201),149-01-12-04(1503)(2201), 149-01-12-13(1503)(2201) | 156,080 | 5,500 |
| | 149-02-06 | 26,490 | 1,209,900 |
| | **වැය ශීර්ෂ 194 විදුලි සංදේශ, විදේශ රැකියා සහ ක්‍රීඩා අමාත්‍යාංශය** | | |
| | 194-01-03 | 200,871 | 8,390 |
| | **වැය ශීර්ෂ 130 රාජ්‍ය පරිපාලන, ආපදා කළමනාකරණ සහ පශු සම්පත් සංවර්ධන අමාත්‍යාංශය** | | |
| | 130-01-05 | 147,041 | 10,850 |

රු. 000'

| නව අමාත්‍යාංශය/විශේෂ වියදම් ඒකකයන්හි නම් | නව අමාත්‍යාංශයට අයත් කාර්යයන් කරගන යාමට අදාලව පවතින අයවැය ප්‍රතිපාදන | | |
|---|---|---|---|
| | වැය විෂයය විස්තර | අතුරු සම්මත ගිණුම පුනරාවර්තන | අතුරු සම්මත ගිණුම මූලධන |
| (1) | (2) | (3) | (4) |
| උසස් අධ්‍යාපන, තාක්ෂණ නවෝත්පාදන | | **1,595,943** | **6,948,250** |
| | **වැය ශීර්ෂ 166 නගර සැලසුම්, ජල සම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශය** | | |
| | 166-01-01 | 9,885 | 940 |
| | 166-01-09 | 107,050 | 923,300 |
| | 166-02-10 | 607,000 | 400,000 |
| | 166-02-12 | - | 4,723,000 |
| | **වැය ශීර්ෂ 52 විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍ය මණ්ඩලයේ සාමාජික නොවන අමාත්‍යාංශය** | | |
| | වැය ශීර්ෂ 52 යටතේ පවතින ව්‍යාපෘති | 517,008 | 804,630 |
| | **වැය ශීර්ෂ149 කර්මාන්ත හා වාණිජ කටයුතු, දිගුකාලීනව අවතැන් වූ පුද්ගලයන් නැවත පදිංචි කිරීම, සමුපකාර සංවර්ධන සහ වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය** | | |
| | 149-01-12-11 | 235,000 | 76,380 |
| | 149-01-12-12 | 120,000 | 20,000 |
| නාගරික සංවර්ධන, ජල සම්පාදන නිවාස පහසුකම් | | **365,845** | **33,514,660** |
| | **වැය ශීර්ෂ 123 නිවාස, ඉදිකිරීම් සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය** | | |
| | පහත සඳහන් වැය විෂයයන් හැර වැය ශීර්ෂ 123 යටතේ පවතින ව්‍යාපෘති 123-01-03,123-02-05,123-02-06,) | 166,870 | 1,707,650 |
| | **වැය ශීර්ෂ 162 මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය** | | |
| | වැය ශීර්ෂ 162 යටතේ පවතින ව්‍යාපෘති | 136,800 | 14,888,900 |
| | **වැය ශීර්ෂ 166 නගර සැලසුම්, ජල සම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශය** | | |
| | 166-01-11 | 10,295 | 730 |
| | 166-01-02 | 51,280 | 2,050 |
| | 166-02-03 | 600 | 3,239,000 |
| | 166-02-04 | - | 243,330 |
| | 166-02-05 | - | 10,134,000 |
| | 166-02-07 | - | 2,274,000 |
| | 166-02-13 | - | 1,025,000 |
| බුද්ධශාසන, සංස්කෘතික හා ආගමික කටයුතු | | **438,856** | **363,150** |
| | **වැය ශීර්ෂ 101 බුද්ධශාසන හා වයඹ සංවර්ධන අමාත්‍යාංශය** | | |
| | පහත සඳහන් වැය විෂයයන් හැර වැය ශීර්ෂ 101 යටතේ පවතින ව්‍යාපෘති 101-02-07 | 81,500 | 172,900 |
| | **වැය ශීර්ෂ 123 නිවාස, ඉදිකිරීම් සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය** | | |
| | 123-01-03 | 99,230 | 28,150 |
| | 123-02-05 | 198,000 | 67,050 |
| | 123-02-06 (රන්මිහිතැන්න හැර) | 29,400 | 73,000 |
| | **වැය ශීර්ෂ 01 අතිගරු ජනාධිපති** | | |
| | 01-01-04-25-(1503)(2201) | 16,700 | 20,000 |
| | **වැය ශීර්ෂ 108 තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යාංශය** | | |
| | 108-01-02 (ව්‍යපෘතියෙන් කොටසක්) | 2,706 | - |
| | **වැය ශීර්ෂ 158 රාජ්‍ය ව්‍යවසාය, කන්ද උඩරට උරුමය සහ මහනුවර සංවර්ධන අමාත්‍යාංශය** | | |
| | 158-02-05 | 11,320 | 2,050 |

රු. 000'

| නව අමාත්‍යාංශය/විශේෂ වියදම් ඒකකයන්හි නම් (1) | නව අමාත්‍යාංශයට අයත් කාර්යයන් කරගන යාමට අදාලව පවතින අයවැය ප්‍රතිපාදන | | |
|---|---|---|---|
| | වැය විෂයය විස්තර (2) | අතුරු සම්මත ගිණුම පුනරාවර්තන (3) | අතුරු සම්මත ගිණුම මූලධන (4) |
| වරාය හා නාවික කටයුතු | | **374,960** | **964,000** |
| | **වැය ශීර්ෂ 176 වරාය හා නාවික කටයුතු සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශය** | | |
| | 176-01-01 | 17,910 | 1,770 |
| | 176-01-02 | 40,380 | 1,790 |
| | 176-01-03 | 28,670 | 2,040 |
| | 176-02-04 | 288,000 | 958,400 |
| කාර්මික අපනයන සහ ආයොජන ප්‍රවර්ධන අමාත්‍යවරයා | | **248,410** | **1,633,808** |
| | **වැය ශීර්ෂ 195 සංවර්ධන උපායමාර්ග සහ ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය** | | |
| | වැය ශීර්ෂ 195 යටතේ පවතින ව්‍යාපෘති | 231,010 | 1,248,808 |
| | **වැය ශීර්ෂ 176 වරාය හා නාවික කටයුතු සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශය** | | |
| | 176-01-05( දක්ෂිණ සංවර්ධන) | 17,400 | 385,000 |
| විදේශ සබඳතා | | **3,963,500** | **273,300** |
| | **වැය ශීර්ෂ 112 විදේශ කටයුතු අමාත්‍යාංශය** | | |
| | වැය ශීර්ෂ 112 යටතේ පවතින ව්‍යාපෘති | 3,963,500 | 273,300 |
| ප්‍රවාහන සේවා කළමනාකරණ | | **4,200,770** | **6,417,580** |
| | **වැය ශීර්ෂ 114 ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය** | | |
| | පහත සඳහන් වැය විෂයයන් හැර වැය ශීර්ෂ 114 යටතේ පවතින ව්‍යාපෘති 114-02-05 | 4,200,770 | 6,417,580 |
| | | **128,119,192** | **182,773,658** |

උපලේඛනය **02**

## අමාත්‍යාංශ සඳහා වෙන්කල රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්වල සීමා

## (ගැසට් පත්‍ර අංක 2153/12)

| අනු අංකය | අමාත්‍යාංශය | I<br>අමාත්‍යාංශයට එකතු කළ යුතු අයිතම අංක | II<br>රජයේ කටයුතු සඳහා වියදමෙහි උපරිම සීමා<br>රු. | III<br>රජයේ කටයුතු පිළිබඳ ගිණුම්වලට බැර කළ යුතු ලැබීම්වල අවම සීමා<br>රු. | IV<br>රජයේ කටයුතුවල හර ශේෂයන්ගේ උපරිම සීමා<br>රු. |
|---|---|---|---|---|---|
| 1 | තොරතුරු සන්නිවේදන තාක්ෂණ අමාත්‍යවරයා | 05101 | 2,000,000 | 500,000 | 20,000,000 |
| | | 05501 | 2,670,000 | 500,000 | 20,000,000 |
| | | 10801 | 1,804,000 | 850,000 | 50,000,000 |
| | | **එකතුව** | **6,474,000** | **1,850,000** | **90,000,000** |
| 2 | අභ්‍යන්තර වෙළඳ, ආහාර සුරක්ෂිතතාවය සහ පාරිභෝගික සුබසාධන අමාත්‍යවරයා | 05501 | 330,000 | 300,000 | 10,000,000 |
| | | 14901 | 350,000 | 300,000 | 5,000,000 |
| | | **එකතුව** | **680,000** | **600,000** | **15,000,000** |
| 3 | නිපුණතා සංවර්ධන,රැකීරක්ෂා හා කම්කරු සබඳතා අමාත්‍යවරයා | 05401 | 3,000,000 | 1,500,000 | 30,000,000 |
| | | 14901 | 10,650,000 | 5,700,000 | 55,000,000 |
| | | 19401 | 20,000,000 | 10,000,000 | 120,000,000 |
| | | 13001 | 9,000,000 | 6,000,000 | 80,000,000 |
| | | **එකතුව** | **42,650,000** | **23,200,000** | **285,000,000** |
| 4 | බුද්ධශාසන, සංස්කෘතික හා ආගමික කටයුතු අමාත්‍යවරයා | 10101 | 5,700,000 | 1,600,000 | 26,000,000 |
| | | 12301 | 17,100,000 | 9,000,000 | 185,000,000 |
| | | 10801 | 196,000 | 100,000 | 10,000,000 |
| | | **එකතුව** | **22,996,000** | **10,700,000** | **221,000,000** |
| 5 | මුදල්,ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යවරයා | 10201 | 8,000,000 | 5,000,000 | 125,000,000 |
| | | 10401 | 5,100,000 | 4,700,000 | 77,000,000 |
| | | 05301 | 540,000 | 50,000 | 6,000,000 |
| | | **එකතුව** | **13,640,000** | **9,750,000** | **208,000,000** |
| 6 | ආරක්ෂක අමාත්‍යවරයා | 10301 | 155,000,000 | 90,000,000 | 292,000,000 |
| | | 13001 | 16,330,000 | 9,200,000 | 137,000,000 |
| | | 15701 | 2,600,000 | 1,500,000 | 25,000,000 |
| | | 15501 | 2,000,000 | 1,000,000 | 36,000,000 |
| | | **එකතුව** | **175,930,000** | **101,700,000** | **490,000,000** |
| 7 | අධිකරණ, මානව හිමිකම් හා නීති ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා | 11001 | 10,000,000 | 7,000,000 | 110,000,000 |
| | | 15701 | 500,000 | 500,000 | 5,000,000 |
| | | **එකතුව** | **10,500,000** | **7,500,000** | **115,000,000** |
| 8 | සෞඛ්‍ය, දේශීය වෛද්‍ය සේවා අමාත්‍යවරයා | 11101 | 1,100,000,000 | 500,000,000 | 3,000,000,000 |
| | | 05301 | 160,000 | 50,000 | 500,000 |
| | | **එකතුව** | **1,100,160,000** | **500,050,000** | **3,000,500,000** |
| 9 | විදේශ සබඳතා අමාත්‍යවරයා | 11201 | 12,000,000 | 10,000,000 | 150,000,000 |
| | | **එකතුව** | **12,000,000** | **10,000,000** | **150,000,000** |
| 10 | ප්‍රවාහන සේවා කළමනාකරණ අමාත්‍යවරයා | 11401 | 4,000,000 | 2,000,000 | 45,000,000 |
| | | **එකතුව** | **4,000,000** | **2,000,000** | **45,000,000** |

| අනු අංකය | අමාත්‍යාංශය | I<br>අමාත්‍යාංශයට එකතු කළ යුතු අයිතම අංක | II<br>රජයේ කටයුතු සඳහා වියදමෙහි උපරිම සීමා<br>රු. | III<br>රජයේ කටයුතු පිළිබඳ ගිණුම්වලට බැර කළ යුතු ලැබීම්වල අවම සීමා<br>රු. | IV<br>රජයේ කටයුතුවල හර ශේෂයන්ගේ උපරිම සීමා<br>රු. |
|---|---|---|---|---|---|
| 11 | මාර්ග මහාමාර්ග අමාත්‍යවරයා | 11701 | 8,000,000 | 3,000,000 | 39,000,000 |
| | | **එකතුව** | **8,000,000** | **3,000,000** | **39,000,000** |
| 12 | මහවැලි, කෘෂිකර්ම වාරිමාර්ග සහ ග්‍රාමීය සංවර්ධන අමාත්‍යවරයා | 11801 | 45,000,000 | 22,500,000 | 340,000,000 |
| | | 13001 | 4,880,000 | 3,000,000 | 43,000,000 |
| | | 16001 | 3,250,000 | 1,500,000 | 15,000,000 |
| | | 05601 | 378,000 | 100,000 | 4,000,000 |
| | | 10101 | 1,300,000 | 800,000 | 10,000,000 |
| | | **එකතුව** | **54,808,000** | **27,900,000** | **412,000,000** |
| 13 | ධීවර හා ජලජ සම්පත් අමාත්‍යවරයා | 11801 | 5,000,000 | 2,500,000 | 30,000,000 |
| | | 05301 | 300,000 | 50,000 | 500,000 |
| | | 05601 | 322,000 | 150,000 | 3,000,000 |
| | | **එකතුව** | **5,622,000** | **2,700,000** | **33,500,000** |
| 14 | විදුලිබල හා බලශක්ති අමාත්‍යවරයා | 11901 | 3,000,000 | 1,100,000 | 23,000,000 |
| | | 11701 | 2,000,000 | 1,000,000 | 6,000,000 |
| | | **එකතුව** | **5,000,000** | **2,100,000** | **29,000,000** |
| 15 | කාන්තා , ළමා කටයුතු සහ සමාජ ආරක්ෂණ අමාත්‍යවරයා | 12001 | 21,500,000 | 12,000,000 | 105,000,000 |
| | | 12401 | 9,300,000 | 8,000,000 | 80,000,000 |
| | | **එකතුව** | **30,800,000** | **20,000,000** | **185,000,000** |
| 16 | ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යවරයා | 12201 | 13,800,000 | 7,400,000 | 85,000,000 |
| | | **එකතුව** | **13,800,000** | **7,400,000** | **85,000,000** |
| 17 | අධ්‍යාපන අමාත්‍යවරයා | 12601 | 990,000,000 | 470,000,000 | 3,700,000,000 |
| | | **එකතුව** | **990,000,000** | **470,000,000** | **3,700,000,000** |
| 18 | වැවිලි කර්මාන්ත සහ අපනයන කෘෂිකර්ම අමාත්‍යවරයා | 13501 | 10,000,000 | 5,000,000 | 60,000,000 |
| | | 12401 | 1,700,000 | 1,000,000 | 13,000,000 |
| | | **එකතුව** | **11,700,000** | **6,000,000** | **73,000,000** |
| 19 | ප්‍රජා සවිබලගැන්වීම් සහ වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යවරයා | 14001 | 5,000,000 | 3,000,000 | 45,000,000 |
| | | 10401 | 2,300,000 | 2,000,000 | 38,000,000 |
| | | 15501 | 350,000 | 150,000 | 3,000,000 |
| | | **එකතුව** | **7,650,000** | **5,150,000** | **86,000,000** |
| 20 | කර්මාන්ත සහ සැපයුම් කළමනාකරණ අමාත්‍යවරයා | 14901 | 9,000,000 | 4,000,000 | 40,000,000 |
| | | **එකතුව** | **9,000,000** | **4,000,000** | **40,000,000** |
| 21 | රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යවරයා | 15501 | 247,800,000 | 99,000,000 | 2,360,000,000 |
| | | 13001 | 9,640,000 | 6,650,000 | 87,000,000 |
| | | 12201 | 1,200,000 | 600,000 | 10,000,000 |
| | | 15701 | 6,500,000 | 2,500,000 | 45,000,000 |
| | | **එකතුව** | **265,140,000** | **108,750,000** | **2,502,000,000** |
| 22 | කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සහ ව්‍යවසාය සංවර්ධන අමාත්‍යවරයා | 15801 | 2,500,000 | 1,000,000 | 14,000,000 |
| | | **එකතුව** | **2,500,000** | **1,000,000** | **14,000,000** |

| අනු අංකය | අමාත්‍යාංශය | I<br>අමාත්‍යාංශයට එකතු කළ යුතු අයිතම අංක | II<br>රජයේ කටයුතු සඳහා වියදමෙහි උපරිම සීමා<br>රු. | III<br>රජයේ කටයුතු පිළිබඳ ගිණුම්වලට බැර කළ යුතු ලැබීම්වල අවම සීමා<br>රු. | IV<br>රජයේ කටයුතුවල හර ශේෂයන්ගේ උපරිම සීමා<br>රු. |
|---|---|---|---|---|---|
| 23 | සංචාරක සහ ගුවන් සේවා අමාත්‍යවරයා | 15901 | 2,700,000 | 1,300,000 | 23,000,000 |
| | | **එකතුව** | **2,700,000** | **1,300,000** | **23,000,000** |
| 24 | පරිසර වනජීවී සම්පත් අමාත්‍යවරයා | 16001 | 9,750,000 | 4,200,000 | 43,000,000 |
| | | 15901 | 2,300,000 | 1,200,000 | 18,000,000 |
| | | **එකතුව** | **12,050,000** | **5,400,000** | **61,000,000** |
| 25 | නාගරික සංවර්ධන, ජල සම්පාදන නිවාස පහසුකම් අමාත්‍යවරයා | 16201 | 4,000,000 | 2,500,000 | 32,000,000 |
| | | 12301 | 2,900,000 | 2,000,000 | 32,000,000 |
| | | 16601 | 3,000,000 | 1,000,000 | 27,000,000 |
| | | **එකතුව** | **9,900,000** | **5,500,000** | **91,000,000** |
| 26 | උසස් අධ්‍යාපන, තාක්ෂණ නවෝත්පාදන අමාත්‍යවරයා | 16601 | 3,000,000 | 1,000,000 | 26,000,000 |
| | | 05201 | 19,000,000 | 7,000,000 | 117,000,000 |
| | | **එකතුව** | **22,000,000** | **8,000,000** | **143,000,000** |
| 27 | වරාය හා නාවික කටයුතු අමාත්‍යවරයා | 17601 | 4,000,000 | 1,500,000 | 27,000,000 |
| | | **එකතුව** | **4,000,000** | **1,500,000** | **27,000,000** |
| 28 | ක්‍රීඩා හා තරුණ කටයුතු අමාත්‍යවරයා | 19401 | 4,000,000 | 1,000,000 | 16,000,000 |
| | | 10401 | 9,600,000 | 8,300,000 | 85,000,000 |
| | | **එකතුව** | **13,600,000** | **9,300,000** | **101,000,000** |
| 29 | කාර්මික අපනයන සහ ආයොජන ප්‍රවර්ධන අමාත්‍යවරයා | 19501 | 5,000,000 | 2,000,000 | 50,000,000 |
| | | **එකතුව** | **5,000,000** | **2,000,000** | **50,000,000** |

උපලේඛන 03

# නව අමාත්‍යාංශ වෙත අග්‍රිම ගිණුම් හා බැංකු ගිණුම් අංක ලබාදීම

| ශීර්ෂ අංකය | අංක 2153/12 හා 2019.12.10 දිනැති ගැසට් පත්‍රය අනුව නව අමාත්‍යාංශයේ නම / වියදම් ඒකක | වෙන් කරන ලද අග්‍රිම ගිණුම් අංක 7002/0/0 | බැංකු ගිණුම | |
|---|---|---|---|---|
| | | | බැංකුව හා ශාඛාව | ගිණුම් අංකය |
| 126 | අධ්‍යාපන අමාත්‍යාංශය | 254 | ලංකා බැංකුව - තැප්‍රොබේන් ශාඛාව | 7040577 |
| 111 | සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශය | 100 | ලංකා බැංකුව - තැප්‍රොබේන් ශාඛාව<br>මහජන බැංකුව - යූනියන් පෙදෙස ශාඛාව | 7040247<br>14100129025190 |
| 51 | තොරතුරු සංනිවේදන තාක්ෂණ අමාත්‍යාංශය | 419 | ලංකා බැංකුව - කොල්ලුපිටිය අධි ශ්‍රේණිය | 7041015 |
| 103 | ආරක්ෂක අමාත්‍යාංශය | 27 | ලංකා බැංකුව - තැප්‍රොබේන් ශාඛාව | 7040119 |
| 155 | රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය | 449 | ලංකා බැංකුව - තැප්‍රොබේන් ශාඛාව | 7040666 |
| 122 | ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය | 383 | ලංකා බැංකුව - බත්තරමුල්ල ශාඛාව | 7040846 |
| 160 | පරිසර වනජීවී සම්පත් අමාත්‍යාංශය | 323 | ලංකා බැංකුව - බත්තරමුල්ල ශාඛාව | 7040898 |
| 159 | සංචාරක හා ගුවන් සේවා අමාත්‍යාංශය | 457 | ලංකා බැංකුව - යූනියන් පෙදෙස ශාඛාව | 7041295 |
| 118 | මහවැලි, කෘෂිකර්ම, වාරිමාර්ග සහ ග්‍රාමීය සංවර්ධන අමාත්‍යාංශය<br>( i) ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය (ඉදිරියේ දී උප කාර්යාලයක් ලෙස සලකනු ලැබේ) | 325 | ලංකා බැංකුව - බත්තරමුල්ල ශාඛාව | 7040472 |
| 102 | මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය | 266 | මහජන බැංකුව - භාණ්ඩාගාර ශාඛාව | 14100279025106 |
| 194 | ක්‍රීඩා හා තරුණ කටයුතු අමාත්‍යාංශය | 376 | ලංකා බැංකුව - ටොරින්ටන් ශාඛාව | 7040742 |
| 110 | අධිකරණ, මානව හිමිකම් හා නීති ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය | 77 | මහජන බැංකුව - නගර මධ්‍ය ශාඛාව | 17610017902518 0 |
| 117 | මාර්ග හා මහා මාර්ග අමාත්‍යාංශය | 332 | ලංකා බැංකුව - තැප්‍රොබේන් ශාඛාව | 7040330 |
| 119 | විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය | 38 | ලංකා බැංකුව - හයිඩ් පාර්ක් ශාඛාව | 7040502 |
| 120 | කාන්තා, ළමා කටයුතු සහ සමාජ ආරක්ෂණ අමාත්‍යාංශය | 379 | ලංකා බැංකුව - බත්තරමුල්ල ශාඛාව | 7040514 |
| 135 | වැවිලි කර්මාන්ත සහ අපනයන කෘෂිකර්ම අමාත්‍යාංශය | 331 | ලංකා බැංකුව - තැප්‍රොබේන් ශාඛාව | 7040714 |
| 140 | ප්‍රජා සවිබලගැන්වීම් සහ වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය | 296 | ලංකා බැංකුව - කොල්ලුපිටිය අධි ශ්‍රේණිය | 7040771 |
| 149 | කර්මාන්ත සහ සැපයුම් කළමනාකරණ අමාත්‍යාංශය | 68 | ලංකා බැංකුව - තැප්‍රොබේන් ශාඛාව | 7040820 |

| ශීර්ෂ අංකය | අංක 2153/12 හා 2019.12.10 දිනැති ගැසට් පත්‍රය අනුව නව අමාත්‍යාංශයේ නම / වියදම් ඒකක | වෙන් කරන ලද අග්‍රිම ගිණුම් අංක 7002/0/0 | බැංකු ගිණුම | |
|---|---|---|---|---|
| | | | බැංකුව හා ශාඛාව | ගිණුම් අංකය |
| | ( i) අභ්‍යන්තර වෙළඳ, ආහාර සුරක්ෂිතතාවය සහ පාරිභෝගික සුභසාධන (ඉදිරියේ දී උප කාර්යාලයක් ලෙස සලකනු ලැබේ) | | | |
| 158 | කුඩා හා මධ්‍ය පරිමාන ව්‍යාපාර සහ ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය | 453 | ලංකා බැංකුව - තැප්‍රොබේන් ශාඛාව | 7042783 |
| 54 | නිපුණතා සංවර්ධන, රැකීරක්ෂා හා කම්කරු සබඳතා අමාත්‍යාංශය | 249 | මහජන බැංකුව - නාරාහේන්පිට ශාඛාව | 119100159025666 |
| 166 | උසස් අධ්‍යාපන, තාක්ෂණ නවෝත්පාදන අමාත්‍යාංශය | 399 | ලංකා බැංකුව - පැලවත්ත ශාඛා ශාඛාව | 7040937 |
| 123 | නාගරික සංවර්ධන, ජල සම්පාදන නිවාස පහසුකම් අමාත්‍යාංශය | 397 | ලංකා බැංකුව - බත්තරමුල්ල ශාඛාව | 7040945 |
| 101 | බුද්ධ ශාසන, සංස්කෘතික හා ආගමික කටයුතු අමාත්‍යාංශය | 209 | ලංකා බැංකුව - යූනියන් පෙදෙස | 7040101 |
| 176 | වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශය | 115 | ලංකා බැංකුව - තැප්‍රොබේන් ශාඛාව | 7040298 |
| 195 | කාර්මික අපනයන සහ ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය | 454 | ලංකා බැංකුව - තැප්‍රොබේන් ශාඛාව | 7042786 |
| 112 | විදේශ සබඳතා අමාත්‍යාංශය | 35 | ලංකා බැංකුව - තැප්‍රොබේන් ශාඛාව | 7040295 |
| 114 | ප්‍රවාහන සේවා කළමනාකරණ අමාත්‍යාංශය | 248 | ලංකා බැංකුව - හයිඩ් පාර්ක් ශාඛාව | 7040312 |